## 2025-01-27 දින පැවැත්වුණු අමාත්‍ය මණ්ඩල රැස්වීමේදී එළඹුණු තීරණ

### 01. 2025 වර්ෂය වෙනුවෙන් මුදල් කොමිෂන් සභාව විසින් ඉදිරිපත් කර ඇති නිර්දේශ

ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154ජ ව්‍යවස්ථාවේ විධිවිධාන පරිදි පළාත් සභා සඳහා අවශ්‍ය සම්පත් අවශ්‍යතාවන් පිළිබඳවත්, පළාත් සභා සඳහා ජාතික අයවැයෙන් වෙන් කෙරෙන ප්‍රදානයන් එක් එක් පළාත් සභාව සඳහා වෙන් කර දීමේ මූලධර්ම පිළිබඳවත් නිර්දේශ ඉදිරිපත් කිරීම මුදල් කොමිෂන් සභාව වෙත පැවරී ඇත. ඒ අනුව, එක් එක් පළාත් සභාව වෙනුවෙන් 2025 වර්ෂයේ ජාතික අයවැය මඟින් වෙන් කර දීම සඳහා මුදල් කොමිෂන් සභාව විසින් නිර්දේශ කරනු ලබන පුනරාවර්තන හා ප්‍රාග්ධන වියදම් අවශ්‍යතා ඇතුළත් වාර්තාව එම කොමිෂන් සභාව විසින් ඉදිරිපත් කරනු ලැබ ඇත. එකී වාර්තාවේ සඳහන් නිර්දේශ ක්‍රියාත්මක කිරීමටත්, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154ජ(7) අනුව්‍යවස්ථාවේ විධිවිධාන පරිදි එම නිර්දේශ පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කිරීමටත් ගරු ජනාධිපතිතුමා ඉදිරිපත් කළ යෝජනාව සඳහා අමාත්‍ය මණ්ඩලයේ අනුමැතිය ලබා දෙන ලදී.

### 02. කොළඹ විශ්වවිද්‍යාලයට අනුබද්ධ ශ්‍රී පාලි මණ්ඩපය සංවර්ධනය කිරීම

කොළඹ විශ්වවිද්‍යාලයට අනුබද්ධ ශ්‍රී පාලි මණ්ඩපය තුළ සිසුන් 850ක් පමණ අධ්‍යාපනය හදාරනු ලබන අතර, සිසුන් හට ක්‍රීඩා කිරීම හා ක්‍රීඩා උත්සව පැවැත්වීම සඳහා සුදුසු ක්‍රීඩා පිටියක් නොමැති වීම දැඩි අඩුපාඩුවක්ව පවතී. එබැවින්, ශ්‍රී පාලි මණ්ඩපයට යාබදව ඇති කොටගල වැවිලි සමාගම යටතේ පවතින සොරණ වතුයායට අයත් වන, දැනට කිසිදු වගාවක් සිදු කර නොමැති අක්කර 2.5ක් වන ඉඩම් කොටසක් පොදු ක්‍රීඩාංගණයක් සඳහා යොදා ගැනීමට හැකි වන පරිදි වෙන් කර ගැනීම සඳහා අදාළ පාර්ශ්වයන් සමඟ සාකච්ඡා කර තිබේ. එම ඉඩම් කොටස වන්දි රහිතව නිදහස් කිරීමට කොටගල වැවිලි සමාගමේ අධ්‍යක්ෂ මණ්ඩලයේ එකඟතාවය ලැබී ඇති අතර, එම කාර්යය සඳහා එකී ඉඩම් කොටස වෙන් කර දීම සම්බන්ධයෙන් එම ඉඩම්වල ස්වර්ණමය කොටස් හිමිකරු වශයෙන් භාණ්ඩාගාරයේ ලේකම්ගේ අනුමැතිය ලැබී ඇත. ඒ අනුව, කොටගල වැවිලි සමාගම යටතේ පවතින සොරණ වතුයායට අයත් ඉඩමෙන් අක්කර 2.5ක ප්‍රමාණයක් කොළඹ විශ්වවිද්‍යාලයට අනුබද්ධ ශ්‍රී පාලි මණ්ඩපය වෙත පවරා ගැනීම පිණිස අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍ය වශයෙන් ගරු අග්‍රාමාත්‍යතුමිය ඉදිරිපත් කළ යෝජනාව අමාත්‍ය මණ්ඩලය විසින් අනුමත කරන ලදී.

03. **ශ්‍රී ලාංකීය විශ්වවිද්‍යාල හා විදේශීය විශ්වවිද්‍යාල අතර අවබෝධතා ගිවිසුම්වලට එළඹීම**

ශ්‍රී ලාංකීය විශ්වවිද්‍යාල ලෝක ශ්‍රේණිගත කිරීම් දර්ශකවල ඉහළට ඔසවා තැබීම හා අන්තර්ජාතිකකරණය උදෙසා විදේශීය විශ්වවිද්‍යාල සමඟ උසස් අධ්‍යාපනික සහයෝගිතාවයන් වර්ධනය කිරීමේ අරමුණ පෙරදැරිව මෙරට විශ්වවිද්‍යාල හා විදේශීය විශ්වවිද්‍යාල සමඟ පහත සඳහන් අවබෝධතා ගිවිසුම් අත්සන් කිරීම පිණිස අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍ය වශයෙන් ගරු අග්‍රාමාත්‍යතුමිය ඉදිරිපත් කළ යෝජනා අමාත්‍ය මණ්ඩලය විසින් අනුමත කරන ලදී:

* අධ්‍යාපන සහ පර්යේෂණ පුහුණු වැඩසටහන් ප්‍රවර්ධනය කිරීම, සංවර්ධනය කිරීම සහ ස්ථාපිත කිරීම සඳහා අවශ්‍ය පියවර ගැනීම, ඒකාබද්ධව වැඩමුළු සම්මන්ත්‍රණ සංවිධානය කිරීම ඇතුළු අන්‍යෝන්‍ය උනන්දුවක් දක්වන ක්ෂේත්‍රවල අධ්‍යාපන වැඩසටහන් පැවැත්වීම අරමුණු කර ගනිමින් ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය හා මහජන චීන සමූහාණ්ඩුවේ වූහාන් ක්‍රීඩා විශ්වවිද්‍යාලය අතර අවබෝධතා ගිවිසුම.

* උසස් අධ්‍යාපනය, විද්‍යාව හා තාක්ෂණය සම්බන්ධයෙන් දෙපාර්ශ්වය අතර අන්‍යෝන්‍ය අවබෝධය සහ සහයෝගිතාව ප්‍රවර්ධනය කිරීම, උසස් අධ්‍යාපන විද්‍යාත්මක පර්යේෂණ සහ ඒ ආශ්‍රිත ක්‍රියාකාරකම් සම්බන්ධ තොරතුරු, අධ්‍යයන කාර්යමණ්ඩල, පර්යේෂකයින් හා ශිෂ්‍යයින් හුවමාරුව සහ ඒකාබද්ධ පර්යේෂණ ක්‍රියාකාරකම් ප්‍රවර්ධනය කිරීම අරමුණු කර ගනිමින් ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය හා ජපානයේ අයිසු විශ්වවිද්‍යාලය අතර අවබෝධතා ගිවිසුම.

* ඒකාබද්ධ පර්යේෂණ, අධ්‍යාපන හා පුහුණු වැඩසටහන් සංවර්ධනය කිරීම සහ ප්‍රවර්ධනය කිරීම මෙන්ම, ශිෂ්‍ය හා අධ්‍යයන කාර්යමණ්ඩල හුවමාරු වැඩසටහන්, ඒකාබද්ධ වැඩමුළු සහ පුහුණු සැසි පැවැත්වීම, ප්‍රකාශන හුවමාරු කර ගැනීම අරමුණු කර ගනිමින් ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය හා නෝර්වේ ඇග්ඩර් විශ්වවිද්‍යාලය අතර අවබෝධතා ගිවිසුම.

* අන්‍යෝන්‍ය වශයෙන් ප්‍රතිලාභ සැලසෙන කෙටිකාලීන පුහුණු පාඨමාලා හා ව්‍යාපෘති හඳුනා ගැනීමේ අරමුණින් ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය හා ඔස්ට්‍රේලියාවේ ඩීකින් විශ්වවිද්‍යාලය අතර අවබෝධතා ගිවිසුම.

* අන්‍යෝන්‍ය අවශ්‍යතා සහ ප්‍රතිලාභ මත පදනම්ව, පශ්චාත් උපාධි වැඩසටහන්වල සහයෝගිතාව ප්‍රවර්ධනය කිරීමේ අරමුණ සහිතව සම්මන්ත්‍රණ සහ ශාස්ත්‍රීය රැස්වීම්වලට සහභාගි වීම, අධ්‍යයන තොරතුරු සහ අනෙකුත් තොරතුරු හුවමාරු කර ගැනීම ආදිය අරමුණු කර ගනිමින් මොරටුව විශ්වවිද්‍යාලය හා චීනයේ ලින්යී විශ්වවිද්‍යාලය අතර අවබෝධතා ගිවිසුම.

* පර්යේෂණ සහ අධ්‍යාපනික වැඩසටහන්වලට අදාළ ඉගැන්වීම්, ඉගෙනුම් ද්‍රව්‍ය සහ අනෙකුත් අදාළ සාහිත්‍ය තොරතුරු හුවමාරු කර ගැනීම, අන්‍යෝන්‍ය උනන්දුවක් දක්වන ක්ෂේත්‍රයන්හි කෙටිකාලීන අඛණ්ඩ අධ්‍යාපනික වැඩසටහන්, සම්මන්ත්‍රණ හෝ වැඩමුළු ඒකාබද්ධව සංවිධාන කිරීම ආදී වූ වැඩසටහන් පැවැත්වීම අරමුණු කර ගනිමින් පේරාදෙණිය විශ්වවිද්‍යාලය හා ඉන්දියාවේ මහත්මා ගාන්ධි වෛද්‍ය විද්‍යා හා තාක්ෂණ විශ්වවිද්‍යාලය අතර අවබෝධතා ගිවිසුම.

* ප්‍රථම උපාධි, පශ්චාත් උපාධි සහ ආචාර්ය උපාධි ඇතුළුව ඒකාබද්ධ පර්යේෂණ සුපරීක්ෂණය, ඉගැන්වීම, පුහුණු, පර්යේෂණ හා නවෝත්පාදන යන සහයෝගිතා ක්ෂේත්‍රයන්හි සීමිත කාලසීමාවක් සඳහා ශිෂ්‍ය, අධ්‍යයන කාර්යමණ්ඩල හා පර්යේෂකයින් හුවමාරුවට පහසුකම් සැලසීම, පරිවාස කථිකාචාර්යවරුන් සඳහා සේවාරම්භක පුහුණු වැඩසටහන් පැවැත්වීම ආදිය අරමුණු කර ගනිමින් ශ්‍රී ලංකා අග්නිදිග විශ්වවිද්‍යාලය හා චීනයේ ෂැන්ඩොන්ග් විද්‍යා හා තාක්ෂණ විශ්වවිද්‍යාලය අතර අවබෝධතා ගිවිසුම.

* පර්යේෂණ සහයෝගිතා වැඩසටහන්, පීය අධ්‍යයන කාර්යමණ්ඩල හා ශිෂ්‍ය හුවමාරු වැඩසටහන්, විදේශයන්හි අධ්‍යයන අවස්ථා, සායනික අත්දැකීම, උපදේශාත්මක සහ සංස්කෘතික වැඩසටහන් ආදිය ප්‍රවර්ධනය කිරීම අරමුණු කර ගනිමින් කැලණිය විශ්වවිද්‍යාලය සහ ඇමෙරිකා එක්සත් ජනපදයේ කෝට්ලන්ඩ් හි නිව්යෝර්ක් රාජ්‍ය විශ්වවිද්‍යාලය අතර අවබෝධතා ගිවිසුම.

* උපාධි සහ පශ්චාත් උපාධි පාඨමාලා වැඩසටහන් සම්බන්ධයෙන් සහයෝගයෙන් කටයුතු කිරීම අරමුණු කර ගනිමින් ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලය සහ ඕස්ට්‍රේලියාවේ රෝයල් මෙල්බර්න් තාක්ෂණ ආයතනය අතර අවබෝධතා ගිවිසුම.

* අධ්‍යාපන සහ ඒකාබද්ධ පර්යේෂණ වැඩසටහන් ප්‍රවර්ධනය කිරීම සහ ඒකාබද්ධව වැඩමුළු හා සම්මන්ත්‍රණ සංවිධාන කිරීම අරමුණු කර ගනිමින් කැලණිය විශ්වවිද්‍යාලය සහ කොරියානු ජනරජයේ ජාතික කොරියානු සමුද්‍රීය හා සාගර විශ්වවිද්‍යාලය අතර අවබෝධතා ගිවිසුම.

04. **කසළ ප්‍රවාහනය සඳහා භාවිත කරන Garbage Compactors මිල දී ගැනීම සඳහා ජපන් යෙන් මිලියන තුන්සියයක ප්‍රදානයක් ලබා ගැනීම**

ශ්‍රී ලංකාව පිරිසිදු, තිරසර සහ පාරිසරික වගකීම් සහිත මොඩලයක් බවට පරිවර්තනය කිරීම Clean Sri Lanka වැඩසටහන යටතේ අපේක්ෂා කරනු ලබයි. ඒ සඳහා අවශ්‍ය දියුණු කසළ කළමනාකරණ යටිතල පහසුකම් නොමැති වීම ඉහත දැක්ම ළඟාකර ගැනීම සඳහා ප්‍රධාන බාධාවක් ලෙස හඳුනා ගනු ලැබ ඇත. ශ්‍රී ලංකා රජයේ ඉල්ලීම මත ජපාන රජය විසින් යෙන් මිලියන 300ක ප්‍රදාන ආධාර ලබා දීම සඳහා එකඟතාව පළ කර ඇති අතර, එම අරමුදල් බස්නාහිර, උතුර සහ නැගෙනහිර පළාත්වල පළාත් පාලන ආයතනයන්හි කසළ කළමනාකරණ ධාරිතාව වැඩි කිරීම සඳහා Garbage Compactors 28ක් ප්‍රසම්පාදනය කිරීම පිණිස යොදා ගැනීමට අපේක්ෂිතය. මෙම ව්‍යාපෘතිය රාජ්‍ය පරිපාලන, පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍යාංශයේ අධීක්ෂණය යටතේ ක්‍රියාත්මක කරනු ලබන අතර එකී ව්‍යාපෘතිය යටතේ බස්නාහිර පළාත සඳහා 14ක්, නැගෙනහිර පළාත සඳහා 8ක් සහ උතුරු පළාත සඳහා 6ක් වශයෙන් Garbage Compactors බෙදාහැරීමට යෝජිතය. ඒ අනුව, ජපාන ආර්ථික සහ සමාජ සංවර්ධන වැඩසටහන යටතේ එකී ප්‍රදානය ලබා ගැනීම පිණිස මුදල්, ක්‍රමසම්පාදන සහ ආර්ථික සංවර්ධන අමාත්‍ය වශයෙන් ගරු ජනාධිපතිතුමා ඉදිරිපත් කළ යෝජනාව අමාත්‍ය මණ්ඩලය විසින් අනුමත කරන ලදී.

05. **"නව සපිරි ග්‍රාමීය ණය යෝජනා ක්‍රමය - සරුසාර" පොලී සහනාධාර යෝජනා ක්‍රමය 2025 වර්ෂයේ සිට වාර්ෂික වැඩසටහනක් ලෙස ක්‍රියාත්මක කිරීම**

කෙටිකාලීන භෝග සහ ගෙවතු වගාවල යෙදෙන සුළු සහ කුඩා පරිමාණ ගොවීන්ගේ කාරක ප්‍රාග්ධන අවශ්‍යතා සපුරාලීම පිණිස "සරුසාර" නව සපිරි ග්‍රාමීය ණය යෝජනා ක්‍රමය හඳුන්වා දී ඇති අතර, එය ශ්‍රී ලංකා මහ බැංකුවේ

ප්‍රාදේශීය සංවර්ධන දෙපාර්තමේන්තුව විසින් 2020 වර්ෂයේ සිට මේ දක්වා ක්‍රියාත්මක කරනු ලැබ ඇත. මෑතකදී පාර්ලිමේන්තුව විසින් සම්මත කරන ලද මහ බැංකු නව පනතේ විධිවිධාන පරිදි එවැනි සහනදායී ණය යෝජනා ක්‍රම ක්‍රියාත්මක කිරීමට මහ බැංකුවට හැකියාවක් නොමැත. එබැවින්, 2025 වර්ෂයේ සිට "සරුසාර" නව සපිරි ග්‍රාමීය ණය යෝජනා ක්‍රමය වාර්ෂික වැඩසටහනක් ලෙස මහා භාණ්ඩාගාරයේ සංවර්ධන මූල්‍ය දෙපාර්තමේන්තුව මඟින් ක්‍රියාත්මක කිරීම පිණිස මුදල්, ක්‍රමසම්පාදන සහ ආර්ථික සංවර්ධන අමාත්‍ය වශයෙන් ගරු ජනාධිපතිතුමා ඉදිරිපත් කළ යෝජනාව අමාත්‍ය මණ්ඩලය විසින් අනුමත කරන ලදී.

**06. විදේශ කටයුතු, විදේශ රැකියා සහ සංචාරක අමාත්‍යාංශය සහ ඉතාලි ජනරජයේ විදේශ කටයුතු සහ ජාත්‍යන්තර සහයෝගිතා අමාත්‍යාංශය අතර දේශපාලන උපදේශන යාන්ත්‍රණයක් ස්ථාපිත කිරීම පිළිබඳ අවබෝධතා ගිවිසුම**

දේශපාලන, ආර්ථික, වාණිජ, විද්‍යාත්මක, තාක්ෂණික සහ සංස්කෘතික අංශ ඇතුළුව ද්විපාර්ශ්වික සබඳතා ප්‍රවර්ධනය කිරීම, ශක්තිමත් කිරීම සහ පුළුල් කිරීම අරමුණු කර ගනිමින්, ශ්‍රී ලංකාව සහ ඉතාලිය අතර දේශපාලන උපදේශන යාන්ත්‍රණයක් ස්ථාපිත කිරීම පිළිබඳ අවබෝධතා ගිවිසුමකට අත්සන් කිරීමට යෝජනා වී ඇත. ඒ අනුව, එකී අවබෝධතා ගිවිසුම ශ්‍රී ලංකාවේ විදේශ කටයුතු, විදේශ රැකියා සහ සංචාරක අමාත්‍යාංශය සහ ඉතාලියේ විදේශ කටයුතු සහ ජාත්‍යන්තර සහයෝගිතා අමාත්‍යාංශය අතර අත්සන් තැබීම පිණිස විදේශ කටයුතු, විදේශ රැකියා සහ සංචාරක අමාත්‍යතුමා ඉදිරිපත් කළ යෝජනාව අමාත්‍ය මණ්ඩලය විසින් අනුමත කරන ලදී.

**07. කලාපීය ඒකාබද්ධ බහුවිධ ආපදා අනතුරු ඇඟවීමේ පද්ධති ආයතනයේ සිව්වන අමාත්‍ය සමුළුව පැවැත්වීම**

කලාපීය ඒකාබද්ධ බහුවිධ ආපදා අනතුරු ඇඟවීමේ පද්ධති (RIMES) ආයතනය එක්සත් ජාතීන්ගේ සංවිධානයට අනුබද්ධිත ආසියානු, අප්‍රිකානු හා පැසිෆික් කලාපීය රටවල් 40කට වැඩි සංඛ්‍යාවක් සාමාජිකත්වය දරන සංවිධානයකි. සිය සාමාජික රටවලට බලපාන ගංවතුර, නියඟය, නායයෑම්, සුළි සුළං වැනි ආපදා සම්බන්ධයෙන් පූර්ව අනතුරු ඇඟවීමේ තාක්ෂණික ක්‍රමෝපාය වැඩිදියුණු කිරීම සඳහා සහයෝගය හා තාක්ෂණික දැනුම ලබා දීම එම සංවිධානයේ අරමුණු වේ. එම ආයතනයේ සිව්වන අමාත්‍ය සමුළුව 2025 වර්ෂයේදී ශ්‍රී ලංකාවේදී පැවැත්වීමට ඉල්ලීමක් ඉදිරිපත් කර තිබේ. ඒ අනුව, කලාපීය ඒකාබද්ධ බහුවිධ ආපදා අනතුරු ඇඟවීමේ පද්ධති ආයතනයේ සිව්වන අමාත්‍ය සමුළුව 2025 අප්‍රේල් මස අවසන් සතිය හෝ මැයි මස පළමු

සතිය තුළ දින 04ක කාලයක් කොළඹදී පැවැත්වීම පිණිස කෘෂිකර්ම, පශු සම්පත්, ඉඩම් සහ වාරිමාර්ග අමාත්‍යතුමා ඉදිරිපත් කළ යෝජනාව අමාත්‍ය මණ්ඩලය විසින් අනුමත කරන ලදී.

08. **තෝරාගත් රෝහල්වල සෞඛ්‍ය පහසුකම් වැඩිදියුණු කිරීමේ ව්‍යාපෘතියේ ව්‍යාපෘති කාලසීමාව දීර්ඝ කිරීම**

චීන රජයේ සහාය ඇතිව ක්‍රියාත්මක කෙරෙන සෞඛ්‍ය පහසුකම් වැඩිදියුණු කිරීමේ ව්‍යාපෘතිය යටතේ වෛද්‍ය උපකරණ සහ අනෙකුත් උපකරණ සපයමින් තෝරාගත් රෝහල්වල සෞඛ්‍ය පහසුකම් වැඩිදියුණු කිරීම සිදු කෙරේ. ඒ යටතේ රෝහල් 13ක විවිධ විශේෂිත ඒකකයන්ගෙන් සමන්විත රෝහල් ගොඩනැගිලි සංකීර්ණ ඉදිකිරීමටත්, ඒ සඳහා අවශ්‍ය වෛද්‍ය උපකරණ සහ අනෙකුත් උපකරණ සැපයීමටත් මේ වන විට කටයුතු කරමින් පවතී. මෙම ව්‍යාපෘතිය යටතේ රෝහල් 08ක ඉදිකිරීම් කටයුතු අවසන් කර ඇති අතර, එක් රෝහලක හැර අනෙකුත් රෝහල් 04හි ප්‍රගතිය 90%ක් පමණ ඉක්මවා තිබීම සැලකිල්ලට ගනිමින් ව්‍යාපෘතියේ කටයුතු කඩිනමින් නිම කිරීමට හැකි වන පරිදි ව්‍යාපෘති කාලසීමාව 2025-12-31දින දක්වා දීර්ඝ කිරීම පිණිස සෞඛ්‍ය සහ ජනමාධ්‍ය අමාත්‍යතුමා ඉදිරිපත් කළ යෝජනාව අමාත්‍ය මණ්ඩලය විසින් අනුමත කරන ලදී.

09. **ඉඩම් පරිහරණ ප්‍රතිපත්ති සැලසුම් දෙපාර්තමේන්තු පනත කෙටුම්පත් කිරීම**

2010-05-20 දිනැති අති විශෙෂ ගැසට් නිවේදනය මඟින් ඉඩම් පරිහරණ ප්‍රතිපත්ති සැලසුම් දෙපාර්තමේන්තුව ස්ථාපිත කිරීමත්, එහි කාර්යයන්/වගකීම් නිශ්චිත කිරීමත් සිදු කරනු ලැබ ඇත. ඉඩම් පරිහරණ ප්‍රතිපත්ති සැලසුම් දෙපාර්තමේන්තුවේ කාර්යභාරය වඩාත් ඵලදායීව ක්‍රියාවට නැංවීම සඳහා නෛතික පසුබිමක් සැකසීම පිණිස පාර්ලිමේන්තු පනතක් මඟින් එම දෙපාර්කමේන්තුවේ කාර්යයන් හා බලතල නිශ්චය කිරීම යෝග්‍ය බවට හඳුනාගෙන තිබේ. ඒ අනුව, ඒ සඳහා විධිවිධාන ඇතුළත්ව පනත් කෙටුම්පතක් සකස් කරන ලෙස නීති කෙටුම්පත් සම්පාදක වෙත උපදෙස් දීම පිණිස කෘෂිකර්ම, පශු සම්පත්, ඉඩම් සහ වාරිමාර්ග අමාත්‍යතුමා ඉදිරිපත් කළ යෝජනාව අමාත්‍ය මණ්ඩලය විසින් අනුමත කරන ලදී.

************